# The Constitution of the Democratic  Socialist Republic of Sri Lanka

**තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අයිතිවාසිකම.**

[3] 14අ. (1) සෑම පුරවැසියකුට ම -

(අ) රජය, අමාත්‍යාංශයක් හෝ යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ යම් නීතියක් මගින් හෝ යටතේ පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් සතුව පවත්නා වූ;

(ආ) යම් පළාත් අමාත්‍ය මණ්ඩලයක අමාත්‍යවරයකුගේ යම් අමාත්‍යාංශයක් හෝ යම් දෙපාර්තමේන්තුවක් හෝ පළාත් සභා ප්‍රඥප්තියක්  මගින් පිහිටුවනු ලැබූ හෝ ඇති කරනු ලැබූ යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ සතුව පවත්නා වූ;

(ඇ) යම් පළාත් පාලන ආයතනයක් සතුව පවත්නාවූ; සහ

(ඈ) මේ අනු ව්‍යවස්ථාවේ (අ), (ආ) හෝ (ඇ) ඡේදවල සඳහන් ආයතනවලට අදාළව වෙනත් යම් තැනැත්තකු සතුව පවත්නා වූ,

සහ පුරවැසියකුගේ අයිතියක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වූ යම් තොරතුරක් වෙත නීතියෙන් සලසා ඇති පරිදි ප්‍රවේශ වීමේ අයිතිවාසිකම ඇත්තේ ය.

(2) ජාතික ආරක්ෂාව, භෞමික අඛණ්ඩතාව හෝ මහජන ආරක්ෂාව තහවුරු කිරීම පිණිස ද, විෂමාචාර හෝ අපරාධ වැළැක්වීම පිණිස ද, සෞඛ්‍යය හෝ සදාචාරය ආරක්ෂා කිරීම පිණිස ද, අන් අයගේ කීර්තිය හෝ  අයිතිවාසිකම්  ආරක්ෂා කිරීම  පිණිස ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම පිණිස ද, අධිකරණයට අපහාස කිරීම වැළැක්වීම පිණිස ද, පාර්ලිමේන්තු වරප්‍රසාද ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ද විශ්වාසය මත දැනුම් දෙන ලද තොරතුරු හෙළිදරව් කිරීම වැළැක්වීම පිණිස ද හෝ අධිකරණයේ අධිකාරී බලය හා අපක්ෂපාතීත්වය පවත්වාගෙන යාම පිණිසද, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයකට අවශ්‍ය වන්නා වූ නීතියෙන් නියම කරනු ලැබිය හැකි සීමා කිරීම් හැර වෙනත් කවර හෝ සීමාකිරීමක් මේ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශ කොට පිළිගෙන ඇති අයිතිවාසිකම මත නොපැනවිය යුත්තේ ය.

(3)  මේ ව්‍යවස්ථාවේ 'පුරවැසියා' යන්නට, යම් ව්‍යවස්ථාපිත වූ හෝ ව්‍යවස්ථාපිත නොවූ මණ්ඩලයක සාමාජිකයන්ගෙන් හතරෙන් තුනකට නොඅඩු සංඛ්‍යාවක්  පුරවැසියන්  වන්නේ නම්,  එවැනි මණ්ඩලයක් ඇතුළත් වේ.